# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත

---

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 04 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1996 දෙසැම්බර් මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 1.50 යි.

තැපැල් ගාස්තුව : 2.55 යි.

# 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත

[සහතිකය සටහන් කළේ 1996 දෙසැම්බර් මස 04 වන දින]

එල්. ඩී.— ඕ. 35/95

**රෙදිපිළි පංගු මණ්ඩලයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1996 අංක 33 දරන රෙදිපිළි පංගු මණ්ඩලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. *(කෙටි නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය)*

2. (1) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, රෙදිපිළි පංගු මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. *(රෙදිපිළි පංගු මණ්ඩලය පිහිටුවීම.)*

(2) මණ්ඩලය (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවැරීම ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

3. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :— *(මණ්ඩලයේ සාමාජිකයෝ.)*

(අ) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අමාත්‍යාංශයේ වෙනත් යම් නිලධරයකු ;

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු;

(ඇ) රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු;

(ඇ) වාණිජ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු;

(ඉ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන තැනැත්තකු; සහ

(ඊ) රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත අපනයනය කිරීම හා සම්බන්ධ සංගම් නියෝජනය කිරීම පිණිස අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "පත් කරන ලද සමාජිකයන් "යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තන් පස් දෙනකුට වැඩි නොවන වෙනත් තැනැත්තන් සංඛ්‍යාවක්.

(2) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන පත් කරන ලද සාමාජිකයන් කෙරෙහි බලපැවැත්විය යුතු ය.

4. මණ්ඩලයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

(අ) ශ්‍රී ලංකාවට ප්‍රදානය කර ඇති රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත අපනයන පංගු පාලනය කිරීම, බෙදා දීම, උපයෝගී කර ගැනීම හා වෙන් කර දීම සඳහා උචිත යෝජනා ක්‍රමයක් හෝ යෝජනා ක්‍රම සකස් කිරීම සහ ඒ යෝජනා ක්‍රමය හෝ යෝජනා ක්‍රම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ පසු පාලනය කිරීම හා කරගෙන යාම ; සහ

(ආ) (අ) ඡේදය යටතේ සකස් කරන ලද යෝජනා ක්‍රමය හෝ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සහ එහි උපදෙස් ලබාගැනීම සඳහා අමාත්‍යවරයා විසින් ඒ වෙත යොමු කරනු ලැබිය හැකි වෙනත් යම් කාරණා මත අමාත්‍යවරයාට උපදෙස් දීම.

5. මණ්ඩලයේ පරමාර්ථ කරගෙන යාමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කරනු ලැබිය හැකි ය :—

(අ) අපනයන පංගු බෙදාදීම, උපයෝගී කර ගැනීම, හා වෙන්කර දීම සඳහා වූ යෝජනා ක්‍රමය හෝ යෝජනා ක්‍රම පාලනය කිරීම හා කරගෙන යාම ;

(ආ) අපනයන පංගු, ලියාපදිංචි කළ අපනයනකරුවන් අතර වෙන්කර දීම සහ අපනයන පංගු වෙන්කර දීම් වෙනස් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම හෝ නැවත ලබාදීම;

(ඇ) අපනයන පංගු වෙන්කර දෙනු ලබන්නේ කවර නියම හා කොන්දේසි යටතේ ද ඒ නියම හා කොන්දේසි තීරණය කිරීම;

(ඈ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් ලියාපදිංචි කළ අපනයනකරුවන්ගේ නිෂ්පාදන ධාරිතාව, සේවා නියුක්තිය, නිෂ්පාදනය. අපනයන පංගු උපයෝගී කර ගැනීම, අලෙවි කිරීමේ වැඩසටහන් හා වෙනත් යම් අදාළ කාරණාවලට අදාළ තොරතුරු සපයන ලෙස ඔවුන්ට විධාන කිරීම;

(ඉ) යෝජනා ක්‍රමය හෝ යෝජනා ක්‍රම පාලනය කිරීමට හා අපනයන පංගු උපයෝගී කර ගැනීමට අදාළ තොරතුරු එක් රැස් කිරීම, සංචනය කිරීම, වර්ග කිරීම හා පළකිරීම;

(ඊ) ලියාපදිංචි කළ අපනයනකරුවන්ට වෙන්කර දී ඇති අපනයන පංගු උපයෝගී කර ගැනීම කලින් කල අධීක්ෂණය කිරීම;

(උ) චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීම , දැරීම භාරගැනීම, බද්දට දීම, උකස් කිරීම හෝ කුලියට දීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ඌ) බැංකු ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම;

(එ) ලියාපදිංචි කළ අපනයනකරුවන්ට සලසන ලද හෝ සපයන ලද යම් සේවා සඳහා නැතහොත් ඒ අපනයනකරුවන් ලියාපදිංචි කිරීමේ දී ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම;

(ඒ) ස්වකීය නිලධරයන්, සේවකයන් හා අනුයෝජිතයන් පත්කිරීම, සේවයේ යෙදවීම, පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් කෙරෙහි විනයානුකූල පාලනය ක්‍රියාත්මක කිරීම සහ සේවයෙන් පහකිරීම;

(ඹ) මණ්ඩලයේ රැස්වීම්වලට අදාළව සහ මේ පනත යටතේ රීති සෑදීමට නියම කරනු ලැබ ඇති කාරණා සම්බන්ධයෙන් රීති සෑදීම;

(ඕ) සාමාන්‍යයෙන්, මණ්ඩලයේ කර්තව්‍ය නිසි ලෙස ඉටුකිරීම පහසු කරලීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් සියලු දේවල් කිරීම.

අපනයන පංගු වෙනස් කිරීමට අත්හිටුවීමට හා අවලංගු කිරීමට ඇති බලය.

6. (1) යම් ලියාපදිංචි කළ අපනයනකරුවකුට වෙන්කර දෙන ලද අපනයන පංගුවක් —

(අ) ඒ අපනයන පංගුව ලබාගෙන ඇත්තේ කරුණු වරදවා දැක්වීමෙන් බව ;

(ආ) වෙන්කර දෙන ලද අපනයන පංගුවක් රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත නිපදවීම පිණිස ස්ථාපනය කරන ලද ධාරිතාව බොහෝ සෙයින් ඉක්මවන බව;

(ඇ) ආනයනය කරන රටවල් විසින් තවදුරටත් ප්‍රමාණාත්මක සීමා නියම කර ඇති බව හෝ ප්‍රමාණවත් තරම් පංගු නොතිබීම හේතුකොටගෙන අපනයන පංගු පාලනය, බෙදාදීම හා වෙන්කරදීම සඳහා සකස් කරන ලද යොජනා ක්‍රමය සංශෝධනය කිරීමට යෙදුනු බව ;

(ඈ) කර්මාන්ත ශාලාවක කාර්ය සාධනය සමාලෝචනය කිරීමෙන් පසු, ඒ ලියාපදිංචි කළ අපනයනකරු විසින් අපනයන පංගු උපයෝගී කර නොගැනීමට ඉඩ ඇති බව ;

(ඉ) අපනයන පංගු වෙන්කර දෙන විට මණ්ඩලය විසින් නියම කරනු ලැබූ කොන්දේසි පිළිපැද නැති බව;

(ඊ) අපනයන පංගු වෙන්කරදීමක් යටතේ යම් රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිතයක් අපනයනය කිරීම පිණිස ලියාපදිංචි කළ අපනයනකරුවකු විසින් ලබාගැනීමට නියම කරනු ලැබ ඇති අවස්ථාවෝචිත පරිදි, අපනයන බලපත්‍රයක් හෝ රෙදිපිළි වීසා බලපත්‍රයක් හෝ ප්‍රභව සහතිකයක් ඒ අපනයනකරු විසින් ව්‍යාජ ලෙස සකස් කර ඇති බව හෝ ව්‍යාජ ලෙස සකස්කිරීමට සලස්වා ඇති බව ;

(උ) නිසි අධිකාරය නොමැතිව, ලියාපදිංචි කළ අපනයනකරුවකු විසින් , අවස්ථාවෝචිත පරිදි, අපනයන බලපත්‍රයක, රෙදි පිළි වීසා බලපත්‍රයක හෝ ප්‍රභව සහතිකයක යම් වෙනස්කිරීමක් කර ඇති බව හෝ යම් වෙනස්කිරීමක් කිරීමට සලස්වා ඇති බව;

(ඌ) ලියාපදිංචි කළ අපනයනකරුවකු විසින් අපනයන බලපත්‍රයක් හෝ රෙදිපිළි වීසා බලපත්‍රයක් හෝ ප්‍රභව සහතිකයක් සඳහා ඉල්ලුම් කරන විට, වැදගත්වන විස්තරයක් සම්බන්ධයෙන් අසත්‍ය හෝ නොමඟ යවන සුළු තොරතුරු ඔහු විසින් සපයා තිබෙන බව හෝ යම් වැදගත් වන විස්තර අතහැර දමා ඇති බව ;

(එ) ව්‍යාජ ලෙස සකස් කරන ලද හෝ වෙනස් කරන ලද අපනයන බලපත්‍රයක්, රෙදිපිළි වීසා බලපත්‍රයක්, ප්‍රභව සහතිකයක් නැතහොත් රෙදිපිළි හෝ රෙදිපිළි නිෂ්පාදිත අපනයනය කිරීමට අදාළ හෝ සම්බන්ධ වෙනත් යම් ලේඛනයක් ලියාපදිංචි කළ අපනයනකරුවකු විසින් හෝ ලියාපදිංචි කළ අපනයනකරුවකුගේ යම් සේවකයකු හෝ නියෝජිතයකු විසින් භාවිත කරනු ලැබ ඇති බව ;

(ඒ) ලියාපදිංචි කළ අපනයනකරුවකු විසින් යම් අයථා ක්‍රියාවක් කරනු ලැබ ඇති බව ; සහ

(ඔ) රෙදිපිළි පංගු සෙස් බද්ද ගෙවීමට ලියාපදිංචි කළ අපනයනකරුවකු අසමත්වී ඇති බව හෝ ප්‍රතික්ෂේප කර ඇති බව

මණ්ඩලය විසින් සොයාගත් අවස්ථාවක, ඒ අපනයන පංගුව මණ්ඩලය විසින් වෙනස් කිරීම, අත්හිටුවීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ (ඊ), (උ), (ඌ) හෝ (එ) ඡේද යටතේ, රෙදිපිළි පංගු වෙන්කර දීම වෙනස් කරන ලද්දේ, අත්හිටුවන ලද්දේ හෝ අවලංගු කරන ලද්දේ යම් තැනැත්තකුගේ ද අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනස් කිරීමට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට අමතරව, ඒ තැනැත්තාට විරුද්ධව මේ පනතේ 23 වන වගන්තිය යටතේ යම් අපරාධ නඩු පැවරීමක් මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි ඇතුළත් කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය.

සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික.

7. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් මණ්ඩලයේ අරමුදලින් එහි සාමාජිකයන්ට ගෙවනු ලැබිය හැකි ය.

රැස්වීම්වල දී සභාපතිවරයා මුලසුන දරිය යුතු බව.

8. (1) මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය සභාපතිවරයා පැමිණ සිටින්නේ නම්, ඔහු විසින් දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා යම් රැස්වීමකට පැමිණ නොමැති විටක පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරීමට ඔවුන් අතුරින් එක් සාමාජිකයකු තෝරා පත්කර ගත යුතු ය.

(2) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට, තමාගේම ඡන්දයට අතිරේකව, තීරණ ඡන්දයක් තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වූ ලෙස නො සැලකිය යුතු බව.

9. මණ්ඩලයේ යම් සාමාජිකයකුගේ පත්වීම පිළිබඳ වූ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නො ලැබිය යුතු ය.

මණ්ඩලයේ මුද්‍රාව.

10. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් තීරණය කොට සකස් කරගනු ලැබිය යුතු අතර මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ මුද්‍රාව, මණ්ඩලයේ සභාපතිවරයාගේ භාරයේ තිබිය යුතු ය.

(3) මණ්ඩලයේ අනුමතය ඇතිව හැර සහ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට හැර, මණ්ඩලයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටින බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලයේ මුද්‍රාව තැබීමට යෙදෙන සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

11. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත ආණ්ඩුව විසින් මණ්ඩලය වෙත ලබාදෙන මුදල් ප්‍රමාණයකින් මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය සමන්විත විය යුතු ය. මණ්ඩලයේ ප්‍රාග්ධනය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයකින් කලින් කල මණ්ඩලයේ ප්‍රාග්ධනය වැඩි කරනු ලැබිය හැකි අතර ඒ මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසි මත ප්‍රදාන හෝ ණය මුදල් වශයෙන් මණ්ඩලය වෙත ලබා දිය යුතු ය.

12. (1) මණ්ඩලයට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ඒ අරමුදලට — මණ්ඩලයේ අරමුදල.

(අ) 11 වන වගන්තිය යටතේ මණ්ඩලයට ලබාගැනීමට සලස්වා ඇති යම් මුදල් ;

(ආ) මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කාර්ය කිරීමෙහි ලා හා කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවරාකාර වූ හෝ යම් ප්‍රභවයකින් ත්‍යාග, තෑගි හෝ ප්‍රදන මාර්ගයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල්

බැරකරනු ලැබිය යුතු ය.

(2) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා හා කාර්ය කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරනු ලබන වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

13. (1) මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මණ්ඩලයේ මුදල් වර්ෂය.

(2) මණ්ඩලයේ ආදයම හා වියදම පිළිබඳව වත්කම් හා බැරකම් පිළිබඳව සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව එක් එක් මුදල් වර්ෂය සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීමට අදළ විය යුතු ය.

ප්‍රධාන විධායක නිලධරයා.

14. සභාපතිවරයා මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්වරයා.

15. (1) අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා, මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස යෝග්‍ය සුදුසුකම් ලත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු අතර, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් හා වෙනත් ප්‍රතිලාභ ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාගේ විධානයට හා පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ කටයුතු හා ගණුදෙනු කළමනාකරණය කිරීම සහ මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් පිළිබඳ පරිපාලනය හා පාලනය භාරව සිටිය යුතු ය.

(3) මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, මේ පනතින් තමා වෙත පවරන ලද, නියම කරන ලද හෝ වෙන් කර දෙන ලද යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක්, මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත පැවරීම අවශ්‍ය යයි සලකනු ලබන කවර හෝ අවස්ථාවක අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එසේ කරනු ලැබිය හැකි අතර ඒ නිලධරයා හෝ සේවකයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව, ඒ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම හෝ කාර්ය කිරීම කරනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලය.

16. (1) මණ්ඩලයේ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය වේ යයි මණ්ඩලය විසින් සලකනු ලබන වෙනත් නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත්කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර ඔවුන්

මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(3) මණ්ඩලයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ ද රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටුකිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත්

එවැනි ම කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, මණ්ඩලය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ ඒ පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය යටතේ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඔහු ද යටත් විය යුතු ය.

මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සංස්ථාවල නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

17. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව මණ්ඩලය සහ ඒ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ වනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව හෝ ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

මණ්ඩලය අමාත්‍යවරයාගේ විධානවලට යටත් විය යුතු බව.

18. මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, එහි කාර්ය කිරීමේ දී සහ එහි කර්තව්‍ය ඉටුකිරීමේ දී, අමාත්‍යවරයා විසින් කලින් කල ලියවිල්ලකින් නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට මණ්ඩලය යටත් විය යුතු අතර, ඒ අනුව ක්‍රියා කළ යුතු ය.

මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරීම.

19. (1) මේ පනත යටතේ වූ මණ්ඩලයේ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරින් යම් බලයක්, කාර්යයක් හා කර්තව්‍යයක් මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට මණ්ඩලය විසින් පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරා දෙනු ලැබූ සෑම සාමාජිකයකු හෝ නිලධරයකු ම, මණ්ඩලය විසින් ඔහුට දෙනු ලැබිය හැකි විධානවලට යටත්ව, ඒ බලතල ක්‍රියාත්මක කිරීම, කාර්ය කිරීම හෝ කර්තව්‍ය ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් බලය පැවරීමක් තිබුනේ වී වුව ද මණ්ඩලය විසින් ම, එසේ පවරා දෙන ලද බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය කිරීමට හා කර්තව්‍ය ඉටු කිරීමට ඊට බලය ඇත්තේ ය.

මණ්ඩලයේ සාමාජිකයන් නිලධරයන් හා සේවකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**20.** මණ්ඩලයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**21.** මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරනු ලැබූ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**22.** (1) (අ) මේ පනත යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධව; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලය විසින් දරන ලද යම් වියදම් මණ්ඩලයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය; එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී මණ්ඩලයට ගෙවන ලද හෝ මණ්ඩලය විසින් අයකර ගන්නා ලද යම් නඩු ගාස්තු අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ නඩුවේ දී ඔහු විසින් දරන ලද යම් වියදම් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් අයකර ගනු ලැබුවහොත් මිස, අරමුදලින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය.

වැරදි. **23.** (1) මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන හෝ මේ පනත යටතේ ඔහු වෙත කරන ලද හෝ පනවන ලද යම් විධානයක් හෝ නියමයක් හෝ අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක, —

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක් හෝ නිලධරයෙක් ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, ඒ ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවෙක්

ඒ වරදට වරදකරුවකු විය යුතු ය :

එසේ වුවද, ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු හෝ ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවකු ඒ වරද තමාගේ දැනීම නොමැතිව කරන ලද බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්‍යෝගයෙන් කටයුතු කළ බව හෝ ඔප්පු කළහොත්, ඔහු ඒ වරද කිරීම සම්බන්ධයෙන් වරදකරු නොවිය යුතු ය.

රීති. **24.** (1) 5 වන වගන්තියෙන් ඒ වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව මණ්ඩලය විසින් පහත දක්වෙන කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය :-

(අ) අපනයන පංගු බෙදදීම, උපයෝගී කර ගැනීම හා වෙන්කර දීම සඳහා මේ පනත යටතේ සකස් කරනු ලබන යම් යෝජනා ක්‍රමයක් හෝ යෝජනා ක්‍රම පාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ කාරණා ;

(ආ) නිෂ්පාදන ධාරිතාව, නිෂ්පාදනය, අලෙවි කිරීමේ වැඩ සටහන් හා අපනයනකරුවන් විසින් සැපයිය යුතු වෙනත් අදාළ කාරණා හා සම්බන්ධ තොරතුරු ; සහ

(ඇ) මණ්ඩලය විසින් සලස්වනු ලබන, යම් සේවාවන් සඳහා අයකළ යුතු ගාස්තු අනුප්‍රමාණ හා ප්‍රමාණය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන රීතියක් එය අමාත්‍යවරයා විසින් අනුමත කොට ගැසට් පත්‍රයේ පළකරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

25. පද සම්බන්ධය අනුව අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ — අර්ථ නිරූපණය.

"අපනයන පංගුව" යන්නෙන්, ශ්‍රී ලංකා ආණ්ඩුව සහ වෙනත් යම් රටක ආණ්ඩුව අතර වූ ගිවිසුමක් යටතේ සහ ඒ අනුව, නිශ්චිත කාලසීමාවක් තුළ දී රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත යම් නිශ්චිත ප්‍රමාණයක් ශ්‍රී ලංකාවෙන් ඒ වෙනත් රටට අපනයනය කිරීම පිණිස හිමිකම් තිබෙන ප්‍රමාණය අදහස් වේ ;

"පාලක මණ්ඩලය" යන්නෙන්, රාජ්‍ය සංස්ථාවක් සම්බන්ධයෙන් වූ විට අධ්‍යක්ෂ මණ්ඩලය හෝ කවරාකාරයකින් නම් කරනු ලැබුව ද සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම භාර කරනු ලැබ ඇති වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහා නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට හා කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇති කොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"අයථා ක්‍රියාව" යන්නට වෙනත් යම් රටක ප්‍රභවයක් ඇති රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් සහිත රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත ලෙස හෝ ශ්‍රී ලංකාවේ ප්‍රභවයක් ඇති රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත වෙනත් රටක ප්‍රභවයක් ඇති රෙදි පිළි හා රෙදිපිළි නිෂ්පාදිත ලෙස, නැවකින් නැවකට පැටවීම; ප්‍රභවය ඇති රට සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ කිරීම; රෙදිපිළි සහ රෙදිපිළි නිෂ්පාදිත නැවකින් නැවකට පැටවීම හෝ ප්‍රති මාර්ගගත කිරීම හෝ නැවකින් නැවකට පැටවීම සහ ප්‍රති මාර්ගගත කිරීම පහසු කිරීමේ අදහස ඇතිව, තිල ලේඛන අසත්‍ය ලෙස සකස් කිරීම සහ ද්විපාර්ශ්වික රෙදිපිළි ගිවිසුම් මග හැරීමේ අදහස ඇතිව වෙළෙඳ භාණ්ඩවල කෙඳි අන්තර්ගතය, ප්‍රමාණය, විස්තරය හෝ වර්ග කිරීම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශ කිරීම ඇතුළත් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, 1982 අංක 17 දරන සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවනු ලබන්නා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"ලියාපදිංචි කළ අපනයනකරු" යන්නෙන්, අවස්ථාවෝචිත පරිදි, රෙදිපිළි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙහි නැතහොත් ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි වී සිටින රෙදිපිළි හා රෙදිපිළි නිෂ්පාදිත අපනයනකරුවෙක් අදහස් වේ ;

"රෙදිපිළි නිෂ්පාදිත" යන්නෙන්, පහත දක්වෙන එක ද්‍රව්‍යයකින් හෝ ද්‍රව්‍ය සියල්ලෙන් ම සාදන ලද නිෂ්පාදනයක් ඇතුළත් වේ :—

කපු, වූල්, කෘත්‍රිම කෙඳි, සිල්ක් මිශ්‍රිත කෙඳි හෝ වෙනත් ශාඛ කෙඳි වේ.

" රෙදිපිළි පංගු සෙස් බද්ද" යන්නෙන්, 1995 අංක 16 දරන මුදල් පනතේ විධිවිධාන යටතේ පනවන ලද සෙස් බද්ද අදහස් වේ.

26. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

## උපලේඛනය

මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයන්ට අදාළ වූ විධිවිධාන
[3 (2) වගන්තිය]

1. යම් තැනැත්තකු —

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකා පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලංකා පුරවැසියකුව සිටීම අවසන් වී ඇත්නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු නම්; හෝ

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් චරිත දූෂණාත්මක වරදක් සම්බන්ධයෙන් කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම් හෝ විඳ ඇත්නම්

ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කරගෙන යාමට නුසුදුස්සෙකු විය යුතු ය.

2. මණ්ඩලයේ සෑම පත්කරන ලද සාමාජිකයකුම ඉල්ලා අස්වීම, මියයාම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම නිසා කලින් ධුරය හිස් කළහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු

දෙකක කාලයක් දක්වා ධූරය දරිය යුතු ය. ඒ සාමාජිකයා ධූරයෙන් ඉවත් කරනු ලැබ ඇත්තේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය :

එසේ වුව ද, මියයාම, ඉල්ලා අස්වීම, හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා සිය ධූරය හිස් කළ සාමාජිකයකු වෙනුවට පත් කරන ලද සාමාජිකයකු විසින්, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දරිය යුතු ය.

**3.** ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, ඒ සඳහා කිසිදු හේතුවක් නොදක්වා මණ්ඩලයේ පත් කරන ලද යම් සාමාජිකයකු ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. මේ ඡේදය යටතේ නියමයක් කරන ලද්දේ කවර පත් කරන ලද සාමාජිකයකු සම්බන්ධයෙන් ද ඒ සාමාජිකයා ගැසට් පත්‍රයේ නියමය පළ කරනු ලැබූ දිනයේ දී ධූරය හිස් කළ ලෙස සලකනු ලැබිය යුතු ය.

**4.** මණ්ඩලයේ පත් කරන ලද සාමාජිකයකු විසින්, තමා ඉල්ලා අස්වන බව අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

**5.** මණ්ඩලයේ පත් කරන ලද යම් සාමාජිකයකු මියයාම, ඉල්ලා අස්වීම හෝ ධූරයෙන් ඉවත් කරනු ලැබීම නිසා ධූරය හිස් කරනු ලැබූ විටෙක, 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරනු ලබන තැනැත්තා තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධූරය දරිය යුතු ය.

**6.** රෝගාතුරවීම, අබලතාවයට පත්වීම, හෝ මාස තුනකට අඩු නොවන කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ පත් කරන ලද යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ නොහැකිවීම පිළිබඳව ලියවිල්ලකින් අමාත්‍යවරයා වෙත දන්වාදීම ඒ සාමාජිකයාගේ කාර්යය විය යුතු ය. ඉන් පසු, අමාත්‍යවරයා විසින් 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ කාලය තුළ ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.